# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ 2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1677/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 06 /11 /2024 පැය 0835

## මාධ්‍ය නිවේදනය

**ගරු ජනාධිපතිතුමාගේ රුව හා අත්සන සහිතව සකස්කල ව්‍යාජ රුපියල් 5000 මුදල් නෝට්ටුවක ඡායාරූපයක් සමාජ මාධ්‍ය වෙත එක්කල සැකකරුවෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

ගරු ජනාධිපතිතුමාගේ රුව සහ අත්සන සහිතව ව්‍යාජ ලෙස සකස්කල රුපියල් 5000 නෝට්ටුවක ඡායාරූපයක් පසුගිය දිනවල මුහුණු පොතේ සංසරණය වූ අතර, ඒ සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඩිජිටල් ව්‍යවහාරික අංශය හා ව්‍යාජ මුදල් විමර්ශන කාර්යංශය මගින් සිදුකල විමර්ශනයකින් පසු එම මුදල් නෝට්ටුවේ ඡායාරූපය සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය කිරීමට කටයුතු කල පුද්ගලයෙකු 2024.11.04 වන දින එම කොට්ඨාසයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදී.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වූ කරතොට, අතුරුගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු 2024.11.05 වන දින කැස්බෑව ගරු මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2024.11.11 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**